සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டு இறுதிமதிப்பீடு - 2021**
**Year End Evaluation**

| ශ්‍රේණිය<br>தரம்<br>Grade | 7 | විෂයය<br>பாடம்<br>Subject | **ක්‍රිස්තියානි ධර්මය** | පත්‍රය<br>வினாத்தாள்<br>Paper | 1,2 | පැය<br>மணித்தியாலம்<br>Hours | 2 |
|---|---|---|---|---|---|---|---|

පහත සඳහන් ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු තෝරන්න.

1. ''අහසේ කුරුල්ලන් දෙස බලන්න. උන් වපුරන්නේවත් කපන්නේවත් අටුකොටුවල රැස්කරන්නේවත් නැත'' මෙම බයිබල් වදන තුළින් අපට පැහැදිලි වන්නේ

   1. දේව මැවිල්ලේ අලංකාරය පිළිබඳවයි
   2. දේව මැවිල්ල තුළ ඇති දේව රැකවරණය පිළිබඳවයි.
   3. දේව මැවිල්ල තුළ සතුන්ට වැදගත් තැනක් හිමිවන බවයි.
   4. දේව මැවිල්ලේ අහසේ කුරුල්ලන් විශේෂ තැනක් ගන්නා බවයි.

2. ස්නාවක ජොහාන්තුමාගේ අති විශේෂ මෙහෙය ගැන වසර ගණනාවකට පෙර ප්‍රකාශ කළ දිවැසිවරයා වන්නේ,

   1. එසකියෙල් දිවැසිවරයා     2.ජෙරමියා දිවැසිවරයා
   3. ආමොස් දිවැසිවරයා     4.යෙසායා දිවැසිවරයා

3. අපගේ ජීවිතවලට පැමිණෙන පරීක්ෂා හා ගැටලු ජයගැනීම සඳහා අප ක්‍රියා කළ යුත්තේ

   1. ජීවිත ගැටලු එන විට දේව වචනය තුළින් ඒවාට සාර්ථක ලෙස මුහුණ දීම
   2. එක එල්ලේම පරීක්ෂාවන් ප්‍රතික්ෂේප නොකිරීම
   3. පරීක්ෂා පැමිණෙන විට විසඳුම් සොයා යාම
   4. අපගේ අලසකම පරීක්ෂාවට ලක්වීමට පහසු මාර්ගයක් බව තේරුම් ගැනීම

4. ජේසුස් වහන්සේ කන්ද උඩ දේශනාවේ දී කළ ඉගැන්වීම් අතරින් එකක් වන්නේ,

   1. රන් අණ     2.ශ්‍රේෂ්ඨතම ආඥාව
   3. වපුරන්නාගේ උපමාව     4.සැබෑ උතුම්කම

5. අර්ථවත් මෙහෙවරක් උදෙසා ස්වාමියා දාසයෙකු මෙන් ක්‍රියා කළ යුතු බව ජේසුස් වහන්සේ ඉගැන් වූ අවස්ථාව වන්නේ,

   1. අන්තිම රාත්‍රී භෝජනයෙන්     2.ගෙත්සෙමනේ යාච්ඤාවෙන්
   3. ශ්‍රාවකයන්ගේ පාද සේදීමෙන්     4.බව්තීස්මය ලබා ගැනීමෙන්

6. දෙමව්පියන් තනි නොකර රැකබලා ගැනීමේ වැදගත්කම ලොවට පෙන්වා දෙමින් ජේසුස් වහන්සේ කුරුසියේ සිටියදී ආදර්ශයක් වූයේ,

1. උන්වහන්සේට පීඩා කළ අය උදෙසා කමාව අයදීමෙන්
2. උන්වහන්සේගේ මව වූ මරියතුමිය ප්‍රේමකළ ශ්‍රාවකයාට භාර කිරීමෙන්
3. මෙහෙවර සාර්ථකව නිම කිරීමෙන්
4. සියල්ලන්ගේ පාපය උදෙසා ජීවිතය පූජා කිරීමෙන්

7. ''උන්වහන්සේගේ ඇලයෙහි මාගේ අත දමා බැලුවොත් මිස නැත්නම් විශ්වාස නොකරමි'' මෙලෙස ප්‍රකාශ කළ ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයා වූයේ,

1. පේදුරු 2.ජාකොබ් 3.ජුදස් 4.තෝමස්

8. පහත සඳහන් සිදුවීම් අතුරින් පෙන්තකොස්ත දින සිදු වූ සිදුවීමක් නොවන්නේ,

1. සැඩ සුළඟක් හමන්නාක් වැනි හැඬක් ඇති වීම.
2. තද වර්ෂාවක් ඇතිවීම
3. ගිනි දලු වැනි දිව් රැස්ව සිටි අය මත පිහිටනු ලැබීම
4. අන්‍ය භාෂා වලින් කතා කිරීම

9. පෙන්තකොස්ත දින ශුද්ධාත්ම දානයෙන් පසු බිහි වූ මුල් කිතුනු සභාවට ම පමණක් සුවිශේෂී වූ ලක්ෂණයකි,

1.ඉගැන්වීම 2.සියල්ල පොදුවේ තබා ගැනීම 3.යාච්ඤාව 4.සහභාගිකම

10. පේදුරුතුමා හා ජොහාන්තුමා සුදර්ශන නම් ලත් දොරටුව ආසන්නයේ දී සුව කළ පුද්ගලයා,

1.උපන් දා පටන් කොර මනුෂ්‍යයෙකි 2.උපන් දා පටන් අන්ධ මනුෂ්‍යයෙකි

3.ලාදුරු රෝගියෙකි 4.අංශභාග රෝගියෙකි

11. පාපයට වැටී සිටින්නන් ඉන් මුදවා ගන්නට අප කටයුතු කරන විට ස්වර්ගයේ මහත් ප්‍රීතියක් ඇතිවන බව අපට පෙන්වා දෙන උපමාව වනුයේ,

1.රන්කාසි දසය පිළිබඳ උපමාව 2.යහපත් සමාරිතයාගේ උපමාව

3.නැතිවූ බැටළුවා පිළිබඳ පමාව 4.වපුරන්නාගේ උපමාව

12. දෙවිඳුන් අපට ලබාදුන් හැකියාවන් නිසි ලෙස පරිහරණය කරමින් අප කළ යුතු වන්නේ,

1. අන් අයගේ ජීවිත සවිමත් කිරීම
2. අවශ්‍ය වූ විට ඉදිරිපත් කිරීම
3. අපගේ පෞද්ගලික පරිහරණයට පමණක් භාවිතා කිරීම
4. හැකියාවන් සඟවා තබා ගැනීම

13. සමාජයේ අවශ්‍යතා ඉදිරියේ කිතුනු අප ක්‍රියා කළ යුත්තේ,

1. මිත්‍රකම්වලට විශේෂ සැලකිල්ලක් දැක්වීම
2. තරාතිරම් අනුව සැලකීම
3. ප්‍රති උපකාර බලාපොරොත්තු නොවීම
4. වාසිදායක තත්වයන් ගැන සැලකිලිමත් වීම

14. ''බිබ්ලියා'' යන නමෙන් ශුද්ධ බයිබලය හැඳින්වූයේ,

1.හෙබ්‍රෙව් භාෂාවෙන් 2.ග්‍රීක භාෂාවෙන් 3.ඉංග්‍රීසි භාෂාවෙන් 4.ජර්මන් භාෂාවෙන්

15. තම යහන ලඟ ලෝක සිතියම තබා ගනිමින් ක්‍රිස්තුස් වහන්සේව නොහඳුනන සෙනඟ උදෙසා යාච්ඤා කිරීමට පුරුදුව සිටියේ,

1.විලියම් කේරි දේවගැතිතුමා 2.ශාන්ත ජෙරෝම්තුමා

3.විලියම් ටින්ඩේල් පූජකතුමා 4.වයික්ලිෆ් පූජකතුමා

16. ශුද්ධ බයිබලයේ පරිවර්තනය සම්බන්ධයෙන් ජෝන් වයික්ලිෆ් පූජකතුමා කළ සේවයකි.

1. පැරණි ගිවිසුම ලතින් බසට පරිවර්තනය කිරීම
2. ලතින් බයිබලය ඉංග්‍රීසි බසට පරිවර්තනය කිරීම
3. ශුද්ධ බයිබලය ඉංග්‍රීසි බසට පරිවර්තනය කිරීම
4. ශුද්ධ බයිබලය ජර්මන් බසට පරිවර්තනය කිරීම

17. සමාරිය ස්ත්‍රිය ජේසුස් වහන්සේ, මෙසියස් වහන්සේ බව පිළිගෙන සාක්ෂි දැරූ ලෙස පළමුව අප කළ යුත්තේ,

1.සැවොම පිළිගැනීම 2.සැමට ආදරය කිරීම

3.උන්වහන්සේව හඳුනා ගැනීම 4.සැම හට සේවය කිරීම

18. ''ඔබ සියල්ලන් ක්‍රිස්තුස් වහන්සේ තුළ එකිනෙකු මෙන් සිටින නිසා ජුදෙව් ............ භේදයක්වත්, දාස ................ භේදයක්වත්, ස්ත්‍රී .................. භේදයක්වත් නැත.

ඉහත බයිබල් පාඨයේ හිස්තැන්වලට සුදුසු වචන කණ්ඩය ඇතුළත් පිළිතුර තෝරන්න.

1.ග්‍රීක, නිර්දාස, පුරුෂ 2.පුරුෂ, නිර්දාස, ග්‍රීක 3.පුරුෂ, ග්‍රීක, නිර්දාස 4.නිර්දාස, ග්‍රීක, පුරුෂ

19. ශු. බයිබලයේ කොටස් ගණන, පැරණි ගිවිසුමේ පොත් ගණන, නව ගිවිසුමේ පොත් ගණන හා මුලු පොත් ගණන ඇතුලත් නිවැරදි පිළිතුර වන්නේ.

1.) 2, 27, 39, 66 2).3, 28, 38, 66 3.)2, 39, 27, 66 4.) 3, 27, 39, 66

20. ශ්‍රී ලංකාව බහු ආගමික හා බහු ජාතික රටකි. අප රට තුළ ඇති විවිධ ආගම් හා විවිධ සංස්කෘතීන් පිළිබඳ කිතුනු අප අධ්‍යයනය කළ යුතු වන්නේ,

1. එය අනිවාර්යයෙන් කළ යුතු නිසා
2. අධ්‍යාපන කටයුතු වලදී ප්‍රයෝජනවත් නිසා
3. අන් අයගෙන් වෙන්ව කටයුතු කිරීමේ පහසුව නිසා
4. සෙසු ආගම් හා ජාතීන් සමඟ සහයෝගයෙන් ක්‍රියා කළයුතු නිසා

## දෙවන කොටස

පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්යර්ය වේ. ඉතිරි ප්‍රශ්න අතරින් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න

පිළිතුරු ලිවිය යුතු මුලු ප්‍රශ්න සංඛ්‍යාව පහකි

1. 1 ජේසුස් වහන්සේට පැමිණි පළමු පරීක්ෂාවට උන්වහන්සේ ලබාදුන් පිළිතුර ලියන්න

2. අද සමාජයේ දරුවන්ට ඇති පීඩාවන් දෙකක් ලියන්න

3 දේව මැවිල්ල චක්‍රාකාරව අදටත් සිදුවන බවට උදාහරණ දෙකක් ලියන්න

4. ස්නාවක ජොහාන් තුමාගේ දෙමව්පියන් නම් කරන්න

5. ජේසුස් වහන්සේ කුරුසියේ දී ප්‍රකාශ කළ පළමු වදන ලියන්න

6. පෙන්තකොස්ත දවසේ සිදු වූ විශේෂ සිදුවීම් දෙකක් ලියන්න

7. මුල් කිතුනු සභාවේ ලක්ෂණ දෙකක් ලියන්න.

8. ඇදහිල්ල තුළ ශක්තිමත් ව ජීවිතය ගොඩනගා ගත යුතු බව ඉගැන්වීමට ජේසුස් වහන්සේ වදාළ ඉගැන්වීම ලියන්න.

9. අපට දී ඇති හැකියා වර්ධනය කරගෙන එය නොසඟවා ක්‍රියාවට නැංවීම අවශ්‍ය බව

පෙන්වීමට ජේසුස් වහන්සේ වදාළ උපමාව නම් කරන්න

10. ඔබ තුළ තිබිය යුතු යහපත් ගුණාංග දෙකක් ලියන්න

2෧10

2. 1. දේව මැවිල්ල පිළිබඳව දෙවියන් වහන්සේ මිනිසාට පැවරූ වගකීම් දෙකක් ලියන්න. (ල 2)

2. මිනිසා විසින් දේව මැවිල්ල විනාශ කරන ආකාර තුනක් ලියන්න (ල 3)

3. දූෂිත තත්ත්වයෙන් ලෝකය ආරක්ෂා කර ගැනීමට ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග

පහක් ලියන්න (ල 5)

3. 1. ජේසුස් වහන්සේ කුරුසිපත් වීමට පෙර ආසන්නම සිද්ධීන් දෙකක් නම් කරන්න. (ල 2)

2. ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ගේ පාද සේදීමෙන් අපට ලබාදෙන ආදර්ශ දෙකක් ලියන්න (ල 3)

3. ජේසුස් වහන්සේ කුරුසපත් වීමට පෙර සිදු වූ සිදුවීම් සියල්ල මගින් ඔබ ලබන ආදර්ශයන්

පහක් ලියන්න. (ල 5)

4. 1. පේදුරු හා ජොහාන්ගේ උපකාර පැතු කොරවූ මිනිසාට පේදුරු පැවසූ වදන් ලියන්න. (ල 2)

2. කොරවූ තැනැත්තා සුව වූ පසු දැක්වූ ප්‍රතිචාරයන් තුනක් ලියන්න (ල 3)

3. ඔබගේ මිතුරා හෝ මිතුරිය අසනීප වූ විට කරනු ලබන යැදුමක් ලියන්න (ල 5)

5. 1. ආශිර්වාද ලබන්නට පැමිණි දරුවන්ට ජේසුස් වහන්සේ පැවසූ වදනක් ලියන්න (ල 2)

2. ජුදෙව් සමාජයේ එතරම් පිළිගැනීමකට ලක් නොවූ කණ්ඩායම් දෙකක් නම් කරන්න (ල 3)

3. ජේසුස් වහන්සේගේ ආදරය අත්දකින ඔබ ඒ පිළිබඳ තුති පුදා යැදුමක් හෝ ගීතිකාවක් ලියන්න

(ල 5)

6 1. මුල් යුගයේ ශුද්ධ ලියවිල්ල ලියැවී තිබූ මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ල 2)

2. වාචිකව පැවැති දේව වචනය ලියා තැබීමට හේතු වූ කරුණු දෙකක් ලියන්න. (ල 3)

3. ඔබ දිනපතා කියවන ශුද්ධ බයිබලය තුළින් ඔබට ලබාගත හැකි මඟ පෙන්වීම් පහක් ලියන්න

(ල 5)

7. පහත මාතෘකා අතරින් දෙකක් තෝරා කෙටි සටහන් ලියන්න.

1. පොළොවේ ලුණු මෙන් වැය වීමේ සේවයක යෙදෙමු

2. නිහතමානීව සේවය කරමු

3. සතුරාට ප්‍රේම කරමු

4. ශ්‍රී ලංකා බයිබල් සමාගම

(ල 5 x2)

# 7 ශ්‍රේණිය
# ක්‍රිස්තු ධර්මය
# I කොටස
# පිළිතුරු පත්‍රය

| | |
|---|---|
| 1) 2 | 11) 3 |
| 2) 4 | 12) 1 |
| 3) 1 | 13) 3 |
| 4) 1 | 14) 2 |
| 5) 3 | 15) 1 |
| 6) 2 | 16) 2 |
| 7) 4 | 17) 3 |
| 8) 2 | 18) 1 |
| 9) 2 | 19) 3 |
| 10) 1 | 20) 4 |

2X20 - 40

**2 වන කොටස**

1 .1 මිනිසා කැමෙන් පමණක් ජීවත් නොවන්නේ ය
2. හිංසනවලට ගොදුරු වීම/ළමා මෙහෙකාර කම/අතවරවලට ලක් වීම (පිටුව 3)
3. වැස්ස ඇතිවීම / දිවා රෑ ඇතිවීම / නව දරු උපත් (පිටුව 9)
4. සෙකරියස් හා එළිසබෙත්
5 පියාණෙනි, ඔවුන්ට කමා වුව මැනව ඔවුන් කරන දේ ඔවුහු නොදනිති
6. සැඩ සුළගක් හැමීම / ගිනි දලු වැනි දිව් බෙදීයාම (පිටුව 43)
7. ඉගැන්වීම/ සහභාගිකම /රොටි කැඩීම (පිටුව 45)
8. අත්තිවාරම් 2
9 රන් කාසි දසය
10. නිහතමානීකම/කරුණාව/ප්‍රේමය/දයාව ආදී පිළිතුරු.

2X10 - 20

2. 1 පොළොව පුරා පැතිර එය පාලනය කිරීම/ සතුන් ආරක්ෂා කිරීම/ භූමිය රැක ගැනීමේ (පිටුව 5) (ල 2)
2. ගස් කැපීම / වායු දූෂණය / පරිසර දූෂණය (පිටුව 6) (ල 3)
3. සුදුසු පිළිතුරට ලකුණු දෙන්න (පිටුව 7) (ල 5)

3. 1. අන්තිම රාත්‍රී භෝජනය/ගෝලයින්ගේ පාද සේදීම/ගෙත්සෙමන උයනේ යාච්ඤාව (ල 2)
2. නිහතමානි කම /උස් පහත් භේදයක් නොමැති බව (පිටුව 32) (ල 3)
3. පාපවලට පසුතැවීම/නිහතමානී වීම/අන් අයට සේවය කිරීම/යාච්ඤාවට යොමුවීම/දේව කැමැත්තට අවනත වීම (ල 5)

4. 1. රන්රිදී මට නැත මට ඇති දේ ඔබට දෙමි නාසරීය ජේසුස් වහන්සේගේ නාමයෙන් ඇවිදින්න (ල 2)
2. ඇවිදිමින් උඩ පැන්නාහ/දෙවියන් වහන්සේට ප්‍රශංසා කළහ /දේව මාලිගාවට ගොස් ප්‍රශංසා කළහ (ල 3)
3. සුදුසු පිළිතුරට ලකුණු දෙන්න (ල 5)

5 1. දරුවන් නොවළක්වා මා ළඟට එන්න ඉඩහරින්න. දෙවියන් වහන්සේගේ රාජ්‍යය මෙබඳු අය සන්තකය (ල 2)
2. දරුවන්/සමාරිතයන්/දුප්පතුන් (ල 3)
3. සුදුසු පිළිතුරට ලකුණු දෙන්න (ල 5)

6 1. ගල් පුවරු/පැපිරස් පත්‍ර (ල 2)
2. දේව වචනය නොවෙනස්ව පවත්වා ගැනීම/ඉදිරි පරම්පරාවේ ප්‍රයෝජනයට/බොහෝ දෙනෙකුට තේරුම් ගැනීමට (පිටුව72) (ල3)
3. යාච්ඤාවේ වැදගත්කම / බෙදා ගැනීම /සතුරාට ප්‍රේම කිරීම ආදී සුදුසු පිළිතුරට ලකුණු දෙන්න (ල 3)

7 1. 7 පාඩම
2. 8 පාඩම
3 14 පාඩම
4. 76 පිටුව

(5X2)